පේදුරුතුඩුව ප්‍රාදේශීය සභාව
යාපනය දිස්ත්‍රික්කය
----------------------

1. මූල්‍ය ප්‍රකාශන
--------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
-----------------------------------

2017 වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 මාර්තු 28 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2018 සැප්තැම්බර් 30 සභාපති වෙත ඉදිරිපත් කරන ලදී.

1.2 තත්ත්වාගණනය කළ මතය
---------------------------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශනවලින් 2017 දෙසැම්බර් 31 දිනට පේදුරුතුඩුව සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම
-----------------------------------

1.3.1 ගිණුම්කරණ ප්‍රතිපත්ති
------------------------

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී යොදාගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව්කර නොතිබුණි.

1.3.2 ගිණුම්කරණ අඩුපාඩු
---------------------

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) බද්දු පදනමට සභාව විසින් ලබාගත් ජීප් රථයක් සභාවට අයත්ව නොතිබුණි. කෙසේ වුවත් රු. 390,000 ක්වූ එකී වටිනාකම මූල්‍ය ප්‍රකාශනවලට ගෙන තිබූ බැවින්, සමාලෝචිත වර්ෂය සඳහාවූ මූල්‍ය ප්‍රකාශනවල වාහන වටිනාකම වැඩියෙන් දක්වා තිබුණි.

(ආ) පරිත්‍යාග වශයෙන් සභාවට නිකුත් කළ ගලි වාහනය සභාවට අයත්ව නොතිබුණි.කෙසේ වුවත්,රු.1,881,900ක් වූ එහි වටිනාකම පසුගිය වසර 03 තිස්සේ මූල්‍ය ප්‍රකාශනවලට ගෙන තිබූ බැවින් සමාලෝචිත වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනවල වාහන වටිනාකම වැඩියෙන් දක්වා තිබුණි.

(ඇ) සභාවට අයත් ජල බවුසරයක වටිනාකම තක්සේරු කොට මූල්‍ය ප්‍රකාශනවලට ගෙන නොතිබූ බැවින් සමාලෝචිත වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනවල වාහන වටිනාකම අඩුවෙන් දක්වා තිබුණි.

1.3.3 අනුකූල නොවීම

------------------

නීති,රීති රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

----------------------------------------------------------------------

නීති,රීති රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | නීති,රීති රෙගුලාසි සහ කළමනාකරණ තීරණ යොමුව | වටිනාකම | අනුකූල නොවීම |
|---|---|---|---|
| | -------------------------------- | ------------ | --------------------- |
| | | රු. | |
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි | | |
| | I මුදල් රෙගුලාසි 371 | 11,405 | සේවා සපයන්නෙකුට වාහන අලුත්වැඩියා සඳහා ගෙවන ලද අත්තිකාරමක් නිරවුල් කිරීම පසුගිය වර්ෂ 02 ක පුරාම කටයුතු කර නොතිබුණි. |
| | II මුදල් රෙගුලාසි 571 | 2,214,826 | කල් ඉකුත් තැන්පතු වර්ග 26 ක් සම්බන්ධයෙන් පසුගිය වසර 2 සිට වසර 12 පුරාම සභාව විසින් අර්ථවත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. |
| (ආ) | රාජ්‍ය පරිපාලන සහ කළමනාකරණ අමාත්‍යාංශ චක්‍රලේඛ 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 | - | සභා වාහන 03 කට අදාළව ඉන්ධන දහනය පිළිබඳ පරීක්ෂණ වසරකට වැඩිකාලයක් තිස්සේ සිදුකර නොතිබුණි. |
| (ඇ) | උතුරු පළාත් මුදල් චක්‍රලේඛ 2017 මාර්තු 07 දිනැති අංක ජීඑච්/01/2017 | - | නිලධාරීන් පස්දෙනෙකු විසින් ඇප මුදල් ගෙවා නොතිබුණි. |

## 2. මූල්‍ය සමාලෝචනය

----------------------

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

---------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.24,798,273 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.30,645,168 ක් විය.

## 2.2 ආදායම් පරිපාලනය

----------------------

### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්,බිල් කළ ආදායම්,රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

----------------------------------------------------------------------

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබුණු ඇස්තමේන්තුගත ආදායම්,බිල්කළ ආදායම්,රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2017 | | | | 2016 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු. | රු. | රු. | රු. | රු | රු. | රු. | රු. |
| (i)වරිපනම් හා බදු | 60,000 | - | 79,087 | 958,126 | 60,000 | - | 79,087 | 919,487 |
| (ii) කුලී | 5,510,000 | - | 3,752,538 | 121,709 | 6,040,000 | - | 4,412,936 | 117,309 |
| (iii)බලපත්‍ර ගාස්තු | 1,440,000 | - | 2,119,254 | - | 1,170,000 | - | 1,264,442 | - |
| (iv)වෙනත් ආදායම් | 27,275,000 | - | 26,517,276 | - | 18,775,000 | - | 21,888,929 | - |
| එකතුව | 34,285,000 | - | 33,468,155 | 1,079,835 | 26,045,000 | - | 37,645,094 | 1,036,796 |

(ආ) වරිපනම් බදු එකතු කිරීමේදී සභාව විසින් උපලේඛන නිකුත්කර නොතිබූ බැවින් ඇස්තමේන්තුගත ආදායම හා රැස්කළ ආදායම අතර වෙනස පදනම්ව සමුච්චිත හිඟය නිශ්චය කර ඇතිබවක් නිරීක්ෂණය විය.

### 2.2.2. වරිපනම් හා බදු

-------------------

රු.958,126 ක් වූ වරිපනම් බදු අයකර ගැනීම සඳහා පසුගිය වසර 01 සිට වසර 23 දක්වාම සභාව විසින් අර්ථවත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

### 2.2.3 කුලී මුදල්

-----------

වෙළඳ අයිතිය බදුදීම

---------------------

එකතුව රු.105,740 ක් වූ හිඟ බදු මුදල් සහ දඩ අයකර ගැනීම සඳහා පසුගිය වසර 03 සිට වසර 09 දක්වාම සභාව විසින් අර්ථවත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

### 2.2.4 බලපත්‍ර ගාස්තු

---------------

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) වෙළඳ බලපත්‍ර

--------------

ලැබිය යුතු වෙළඳ බලපත්‍ර ගාස්තු පිළිබඳ විස්තර ලේඛනයේ ඇතුළත් කර නොතිබුණි. එනමුත් වෙළඳ බලපත්‍ර ආදායම් ලැබුණු විට පමණක් ඒවා ආදායම් ලෙස ගිණුම්ගත කර තිබූ බැවින්, ලැබිය යුතු වෙළඳ බලපත්‍ර ගාස්තු ප්‍රමාණය මූල්‍ය ප්‍රකාශනවලට ගෙන නොතිබුණි.

(ආ) වෘත්තිය බලපත්‍ර

----------------

සභා සීමාවට යටත් මෙට්ටිලායිකර්නි හා නගර් කෝවිල් - දකුණ ප්‍රාදේශවල ඉදිකර ඇති ඩයලොග් විදුලි සන්දේශ කුළුණු වෙනුවෙන් බලපත්‍ර ගාස්තු හා ඉදිකිරීම් ගාස්තු අයකර ගැනීම සඳහා සභාව විසින් අර්ථවත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

2.2.5 උසාවි දඩ මුදල් හා මුද්දර ගාස්තු

---------------------------------

රු.2,187,199 ක් වූ උසාවි දඩ මුදල් සහ රු.5,487,758 ක්වූ මුද්දර ගාස්තු උතුරු පළාත් සභාවේ ප්‍රධාන ලේකම් වෙතින් 2017 දෙසැම්බර් 31 දින වන විට දිගින් දිගටම ලැබිය යුතුව තිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය

------------------------------

3.1 කාර්යසාධනය

----------------

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) කටයුතු කාර්යසාධනයේ ප්‍රමාදයන්

--------------------------------------

රු.9,202,900 ක කොන්ත්‍රාත් පිරිවැයකට කොන්ත්‍රාත්කරුවෙකුට ඉකුත් වර්ෂයේදී භාරදෙනු ලැබූ 2018 මැයි 07 දිනට නිම කළ යුතු සභාවේ ප්‍රධාන කාර්යාල ගොඩනැගිල්ල ඉදිකිරීමේ කාර්යය මේ දක්වාම නිමකර නොතිබූ බැව් නිරීක්ෂණය විය. කෙසේවෙතත් අවස්ථා 3 කදී කාලය දීර්ඝ කරනු ලැබ රු.3,139,701 ක මුදලක් කොන්ත්‍රාත්කරුට ගෙවා තිබුණි.

(ආ) ඝන අපද්‍රව්‍ය කළමනාකරණය

----------------------------------

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

i. ඝන අපද්‍රව්‍ය ජාතික ප්‍රතිපත්තිවලට පටහැනිව බිම දමා පුළුස්සා තිබුණි.
ii. මුදුරුවන් හා කීටයන් පැතිරීම හා ඝන අපද්‍රව්‍ය බැහැර කෙරෙන ප්‍රදේශයේ දුර්ගන්ධය වැළැක්වීම සඳහා මදුරුතෙල් ඉසීමේ කටයුතු කර නොතිබුණි.

3.2 මානව සම්පත් කළමනාකරණය

----------------------------------

සභාව විධිමත් පරිදි මානව සම්පත් බඳවා ගැනීම සහ යෙදවීම සිදුකර නොතිබුණි. එහි ප්‍රතිඵලයක් වශයෙන් මානව සම්පත් 13 ක් විසින් නිමකළ යුතු කාර්යයක් ප්‍රමාදවී තිබුණි.

3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා

---------------------------

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) පසුගිය වර්ෂ 47 තුළදීම දේපළ යළි තක්සේරු කිරීම සඳහා සභාව විසින් අර්ථවත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ආ) සභා බල ප්‍රදේශය තුළ පිහිටි වෙළඳ පොළ කඩකාමර 03 ක් කුලියට දීමට සභාව අසමත්වී තිබුණි.

(ඇ) සුසාන භූමි 34 ක සුසාන භූමි බදු අයකර ගැනීම සඳහා සභාව විසින් අර්ථවත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

3.4 වත්කම් කළමනාකරණය

--------------------------------

3.4.1 නඩත්තු හා අලුත්වැඩියා කටයුතු කිරීමට අසමත්වීම

-----------------------------------------------------------

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) ඉකුත් වර්ෂවල පටන් හානියට පත් තත්ත්වයේ වාහන නවයක් වාහන අංගනයේ අක්‍රියව පැවතුණි.

(ආ) වාහන තුනක මීටර් කියවීම් හානියට පත් තත්ත්වයේ තිබු බැවින් කිලෝමීටරයක් සඳහා වූ ඉන්ධන භාවිතය නිශ්චය කළ නොහැකි විය.

3.4.2 වත්කම් භාරදීමට අසමත් වීම

-----------------------------------

ට්‍රැක්ටර්, පානිය ජල ටැංකි වාහන, ද්විරෝද ට්‍රැක්ටර් ආදි සභාව විසින් භාවිත වාහන 11 ක් සභාවට අයත්ව නොතිබුණි.

3.5 හඳුනාගත් පාඩු

-------------------

මන්තිගායි හි වෙළඳ පොළ ගොඩනැලිල්ලක් ඉදිකිරීම සඳහා 2013 අප්‍රේල් 24 දින රු.18,300,000 ක මුදලකට කොන්ත්‍රාත්තුවකට එළඹ තිබුණි. කෙසේවෙතත් කාර්මික අපහසුතාවයක් හේතුකොට ගෙන එම කොන්ත්‍රාත්තුව කෙළවර කර තිබුණි. ඒ අනුව කොන්ත්‍රාත්කරු විසින් බේරුම් කිරීමේ නඩුවක් ගොනුකරනු ලැබ සභාව විසින් රු.9,440,264 ක මුදලක් කොන්ත්‍රාත්කරුට ගෙවා තිබුණි. රු. 5,976,572 ක් වු වැඩ පමණක් නිමකර තිබු බවත්, නොනිමි වැඩ සඳහා වූ ද්‍රව්‍ය සඳහා වු රු.1,315,512 ක් හැර රු.1,997,588 ක පාඩුවක් සභාවට දැරීමට සිදුවු බවත් නිරීක්ෂණය විය.

4. වගකීම් භාරය සහ යහපාලනය

----------------------------------

අයවැය පාලනය

----------------

අයවැයගත ආදායම සහ තත්‍ය ආදායම අතර රු.19,087 සිට රු.6,813,704 ක් හෙවත් සියයට 32 සිට හිගය 18 දක්වාත් අයවැයගත වියදම හා තත්‍ය වියදම අතර රු.66,306 සිට රු.7,113,195 දක්වා හෙවත් සියයට 41 සිට සියයට 72 දක්වාත් වු පරාසවල විචලන නිරීක්ෂණය විය.

5. පද්ධති පාලනය

----------------

විගණනයේදී නිරීක්ෂණය වූ අඩුපාඩු වරින්වර සභාවේ අවධානයට යොමු කර ඇති අතර පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළයුතුය.

| පද්ධතිය | අඩුපාඩු |
|---|---|
| ගිණුම්කරණය | මිණුම් පත්‍රිකා ලේඛනය සහ ඉඩම් විකුණුම් මත බදු ලේඛනය නඩතුත් කිරීමට අසමත්වීම. |